# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සෙත්සිරිපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No — 10120

ෆැක්ස් / தொலைநகல / Fax — 011-2171635

දුරකථන / தொலைபேசி / Telephone — 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site — www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail — dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO — 1453/2023

ඔබේ අංකය / உமது இலக்கம் / Your No — / 2023

දිනය / திகதி / Date — 20/11/2023 පැය 0920

## මාධ්‍ය නිවේදනය

**01. 2023.11.19 වන දින පොලිස් විශේෂ කාර්ය බලකා නිලධාරින් විසින් සිදු කරන ලද නීති විරෝධී මත්පැන් වැටලීම් සම්බන්ධ වාර්තාව පහත පරිදි වේ.**

| වැටලීම් ගණන | අත්අඩංගුවට ගත් සැකකරුවන් ගණන | නීති විරෝධී මත්පැන් ප්‍රමාණය (ලීටර්) | ගෝඩා ප්‍රමාණය (ලීටර්) | වෙනත් දේපල |
|---|---|---|---|---|
| 02 | 02 | 25 | - | - |

වැටලීම සිදු කර අත්අඩංගුවට ගන්නා ලද සැකකරුවන් අදාළ පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**02. හෙරොයින් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා ගෝනහේන කඳවුර.**

2023.11.19 වන දින දහවල් කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා ගෝනහේන කඳවුරේ නිලධාරීන්ට ලද තොරතුරක් මත රාගම පොලිස් වසමේ රාගම ප්‍රදේශයේ දී **හෙරොයින් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 02 මිලි ග්‍රෑම් 120 ක් හා එම ජාවාරමෙන් උපයා ගන්නා බවට සැකකරන මුදල් රුපියල් 9,500/- ක් සමඟ සැකකරුවකු** අත්අඩංගුවට ගෙන රාගම පොලිස් ස්ථානය වෙත භාර දී ඇත.

අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 53 ක් වූ රාගම ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ. රාගම පොලිසිය මගින් වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**03. මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා පුලියන්කුලම කඳවුර.**

2023.11.19 වන දින උදෑසන කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා පුලියන්කුලම කඳවුරේ නිලධාරීන්ට ලද තොරතුරක් මත ඕමන්ත පොලිස් වසමේ මහිලන්කුලම් ප්‍රදේශයේ දී වැටලීමක් සිදු කර **මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවකු** අත්අඩංගුවට ගෙන ඕමන්ත පොලිස් ස්ථානය වෙත භාර දී ඇත.

අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 20 ක් වූ වව්නියාව ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ. ඕමන්ත පොලිසිය මගින් වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය
පොලිස් මාධ්‍ය කොට්ඨාසය.